39

1st Place Winner
National Productivity
Award 2020

SLSI ISO 9001 SYSTEM CERTIFIED

SLAB ACCREDITED
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/10/01/25/114 | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2023/05/24 |

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (අභ්‍යන්තර විගණන ) 01/2023

සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරින්,

ගණන්දීමේ නිලධාරීන්,

**<u>අභ්‍යන්තර විගණන විමසුම් මෙහෙයුම් පද්ධති පරිගණක වැඩසටහන ක්‍රියාත්මක කිරිම විධිමත් කිරිම.</u>**

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟින් විගණන විමසුම් නිකුත් කර ඇති බවටත්, පිළිතුරු සැපයීමෙහි වගකීම දරණ ආයතන දැනුවත් කිරිමටත්, අදාළ විගණන විමසුම සඳහා එම ආයතන විසින් පිළිතුරු සැපයීමෙන් අනතුරුව එම පිළිතුර අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති බව සනාථ කර ගැනීමටත්, අභ්‍යන්තර විගණන විමසුම් මෙහෙයුම් පද්ධතිය නමින් පරිගණක වැඩසටහනක් 2019 වර්ෂයේ ආරම්භ කර අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබයි. මෙම පද්ධතියට ප්‍රවේශ වී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ඔබ ආයතනයට අදාල අභ්‍යන්තර විගණන විමසුම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට හැකි වන ආකාරයට සියළුම විගණිත ආයතන වෙත මුර පද ලබා දීමට කටයුතු කර ඇත.

නමුත්, වර්තමානය වන විට මෙහි ඇතුලත් කර ඇති තොරතුරු පරිශීලනය කිරිම දකුණු පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව පමණක් සිදු කරන තත්ත්වයක් උද්ගතව ඇති බව නිරීක්ෂණය වී ඇත. මේ හේතුවෙන් ප්‍රමාද වී ඇති විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම කඩිනම් කිරිමට අවශ්‍ය සහය විගණිත ආයතනයන්ගෙන් නොලැබෙන බව අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂක විසින් මා වෙත වාර්තා කර ඇත.

එබැවින්, පහත සඳහන් පරිදි වහාම කටයුතු කරන ලෙස දැනුම් දෙමි.

1. මෙම පරිගණක වැඩ සටහනට ප්‍රවේශ ලබා නොගත් ආයතන වේ නම් වහාම අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වෙත දන්වා තම ආයතනයේ මුර පදය ලබා ගැනීමට කටයුතු කිරිම.

2. තම ආයතනයේ මෙම පරිගණක වැඩ සටහන සම්බන්ධයෙන් කටයුතු කරන ගණකාධිකාරිවරයකු හෝ වෙනත් සුදුසු නිලධාරියකු නම් කර එම නිලධාරියාගේ විස්තර මීට අමුණා ඇති උපලේඛණයේ ආකෘතියට අනුව පිළියෙළ කර වහාම අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.(ඇමුණුම 01)

   එසේම එම නිලධාරියා පසු අවස්ථාවකදී වෙනස් කර, එම නිලධාරියා වෙනුවට වෙනත් නිලධාරියකු පත් කර ඇති අවස්ථා වලදී ඒ බවද පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවට දැන්විය යුතුය.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2234052
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site: www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

3. සෑම කාර්තුවකට වරක් පවත්වනු ලබන විගණන කළමණාකරන කමිටු රැස්වීම්වලට හිඟ විගණන විමසුම් සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කිරිමේදී මෙම පරිගණක වැඩ සටහනෙහි ඇතුලත් තම ආයතනයට අදාළව පිළිතුරු සැපයීමට ඇති හිඟ විගණන විමසුම්වල තොරතුරු සමඟ සැසඳීමක් කර තොරතුරු ඉදිරිපත් කළ යුතුය. තවද තම ආයතනයේ තොරතුරු සමඟ පරිගණක වැඩසටහනෙහි තොරතුරු සමඟ නොසැසඳේ නම් වහාම පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව අමතා අදාළ නොසැසඳීම් නිරවුල් කර ගැනීමෙන් අනතුරුව තොරතුරු ඉදිරිපත් කළයුතුය.

4. ඉහත "2" හි සඳහන් ආකාරයට පත් කළ සම්බන්ධීකරණ නිලධාරියා තම ආයතනයට සම්බන්ධ හිඟ විගණන විමසුම් පවතී ද යන්න මෙම පරිගණක තොරතුරු පද්ධතිය වෙත ප්‍රවේශ වී නිරන්තර සොයා බැලීමක් සිදු කළ යුතු අතර පිළිතුරු සැපයීමට ප්‍රමාද වී ඇති විගණන විමසුම් පවතී නම් ඒ පිළිබඳව ආයතනයේ ඉහළ කළමණාකාරීත්වය දැනුවත් කිරිම, එම නිලධාරියාගේ ප්‍රමුඛ රාජකාරී කටයුත්තක් ලෙස ඔහුට වගකීම පැවරීමට ක්‍රියාකළ යුතු බවද දන්වා සිටිමි.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

පිටපත : 1.ජ්‍යෝෂ්ඨ සහකාර විගණකාධිපති - දැ.ගැ.ස

ඇමුණුම 01

# අභ්‍යන්තර විගණන විමසුම් මෙහෙයුම් පද්ධති සම්බන්ධීකාරක තොරතුරු

1. ආයතනයේ නම :- ..........................................................................................

2. නිලධාරියාගේ නම :- ..........................................................................................

3. තනතුර :- ..........................................................................................

4. දුරකතන අංකය :- ස්ථාවර ..........................................................................................

   ජංගම ..........................................................................................

ඉහත නිලධාරියා අභ්‍යන්තර විගණන විමසුම් මෙහෙයුම් පරිගණක පද්ධති සම්බන්ධීකාරක ලෙස පත් කර ඇති බව සහතික කර ඉදිරිපත් කරමි.

............................................ ............................................

ආයතන ප්‍රධානියාගේ අත්සන දිනය